විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය தலைமுறையொன்றின் பெருமிதம் Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. Pen/Pol/06/26-2024 ඔබේ අංකය / உமது இல. / Your No. ................ දිනය / திகதி / Date 2025.06. 26

**විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි : 10/2024 (සංශෝධන I)**

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>විශ්‍රාමික ජීවිත සහතිකය - 2025</u>**

විශ්‍රාම වැටුප් සඳහා රජය විසින් දරන වියදම රාජ්‍ය ආදායමෙන් 10%ක් පමණ වේ. එබැවින් විශ්‍රාම වැටුප් හිමිගැන්වීමේ දී එය හිමිගැන්විය යුතු නිවැරදි විශ්‍රාමිකයා වෙතම හිමිගැන්වීමත් විශ්‍රාම වැටුප අන්සතු නොවීමත් විශ්‍රාම වැටුප් ගෙවීමේ දී සිදුවන වැරදි හා වංචා වැළැක්වීමට පියවර ගැනීමත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාම වැටුප් විෂයභාර නිලධරයින්ගේ හා විශ්‍රාමිකයින්ගේ ද වගකීමකි.

02. ඒ අනුව විශ්‍රාම වැටුප නියමිත විශ්‍රාමිකයා වෙතම හිමිගැන්වෙන බව තහවුරු කර ගැනීම සඳහා විශ්‍රාමිකයින් වෙතින් වාර්ෂිකව ජීවිත සහතිකය ලබා ගැනීම සිදු කරයි.

03. 2024.12.19 දිනැති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 10/2024 මගින් 2025 වර්ෂය සඳහා විශ්‍රාමිකයින් විසින් ජීවිත සහතික යාවත්කාලීන කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් ලබා දීම සිදු කර ඇත. ඒ අනුව ඇඟිලි සළකුණ මගින් හා ග්‍රාම නිලධරයින් විසින් සකස් කරන ආකෘති පත්‍රය අනුව ජීවිත සහතික ලබා ගෙන ඊට අදාළ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා 2025.03.31 දින දක්වා අවසරය ලබා දී ඇත. එසේ අවසරය ලබා දී ඇති කාල සීමාව තුළ ජීවිත සහතිකය යාවත්කාලීන කර නොමැති විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ඉහත උපදෙස් ලිපියේ සඳහන් කර ඇති විධිවිධාන අනුව අත්හිටුවීම සිදු කළ යුතු වේ. එසේ වුවත් සිංහල අලුත් අවුරුදු උත්සවය, වෙසක් උත්සවය හා පොසොන් උත්සවය ආදී ආගමික උත්සව යෙදීම ද අයහපත් කාලගුණික තත්ත්වයන් මගින් සිදු වූ බලපෑම් පිළිබඳව ද සලකා බලා 2025.03.31 දිනට ජීවිත සහතිකය යාවත්කාලීන නොකළ විශ්‍රාමිකයින් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම නතර නොකරන ලදී.

04. කෙසේ වුව ද මේ වන විට මියගිය, අතුරුදහන්ව හෝ වෙනත් හේතූන් මත ජීවිත සහතිකය යාවත්කාලීන නොකළ විශ්‍රාමිකයින් සංඛ්‍යාව 8,433 ක් බව වාර්තා වී ඇත. රට තුළ ආර්ථික අර්බුදයක් පැවතිය දී දුෂ්කරතා මත විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අරමුදල් සපයන මෙවැනි අවස්ථාවක රජයේ මුදල් අන්සතු වීම මගින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට වන හානිය වළක්වා ගැනීම සඳහා 2025.06.30 දිනට ජීවිත සහතිකය යාවත්කාලීන කර නොමැති විශ්‍රාමිකයින් වෙත විශ්‍රාම වැටුප ගෙවීම 2025 ජූලි මස සිට අත්හිටුවීමට කටයුතු කරනු ලැබේ.

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

05. එබැවින් මේ දක්වා ජීවිත සහතික ලබා දී නොමැති විශ්‍රාමිකයින් 2025.06.30 දිනට පෙර ජීවිත සහතික ලබා දිය යුතු බවට දැනුම්වත් කර ඔවුන් විසින් ඉදිරිපත් කරන ජීවිත සහතික පිළිබඳ තොරතුරු අනුව නිවැරදිව දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට විශ්‍රාම වැටුප් විෂය භාර නිලධරයින් හා ග්‍රාම නිලධරයින් මෙහෙයවනු ඇතැයි අපේක්ෂා කරමි.

Azhami

**චාමින්ද හෙට්ටිආරච්චි**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

දුරකථනය : 011 2 421786
ෆැක්ස් : 011 2 431413
විද්‍යුත් ලිපිනය : pen7policydep@gmail.com

**පිටපත් :-**

1) ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
2) අධ්‍යක්ෂ (විශ්‍රාම වැටුප්), විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
3) සහකාර අධ්‍යක්ෂ (විදේශ විශ්‍රාම වැටුප්), විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

} කරු. 2025 වර්ෂය සඳහා ජීවිත සහතික යාවත්කාලීන කර නොමැති විදේශගත විශ්‍රාමිකයින්ට අදාළව ඉහත විධිවිධාන අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා